**කොට්කාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව - 2020**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කොට්කාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට කොට්කාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | **පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය** | | |
| (අ) | ප්‍රමිතියේ 3.6 වගන්තිය ප්‍රකාරව ප්‍රවර්තන මූල්‍ය ප්‍රකාශන කාලපරිච්ඡේදයේ ඉදිරිපත් කර ඇති සියලුම වටිනාකම් සඳහා පෙර වූ සමාන කළ හැකි කාලපරිච්ඡේදය සම්බන්ධ සැසඳිය හැකි තොරතුරු තුලනාත්මකව ඉදිරිපත් කළ යුතු වුවත්, විස්තීරණ ආදායම් ප්‍රකාශයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ එම පූර්ව වර්ෂයේ තොරතුරු හෙළිදරව් කර නොතිබුණි. | නව ගිණුම්කරණ ප්‍රමිතියට අදාළව සකස් කරනු ලැබූ පළමු මූල්‍ය ප්‍රකාශය මෙය වන බැවින්, ඉදිරි වර්ෂයන්හි මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී උපදෙස් අනුව කටයුතු කරමි. | ප්‍රමිත හා ගැසට් පත්‍රයේ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | ප්‍රමිතියේ 3.9 වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල අයවැයගත තොරතුරු, එනම් මුල් අයවැය, අවසාන අයවැය හා ඒ අතර ප්‍රමාණාත්මක වෙනස්වීම් ඇත්නම් ඒවාට හෙළිදරව් කිරීම් ආදිය සිදුකර නොතිබුණි. | ඉදිරි වර්ෂයයේදී නිසි පරිදි අදාළ හෙළිදරව් කිරීම සිදුකරමි. | ප්‍රමිත හා ගැසට් පත්‍රයේ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | ප්‍රමිතියේ 9.9 වගන්තිය ප්‍රකාරව වෙනත් විස්තිරණ ආදායම් තුළ ඇති අයහාරවල තෘප්ත නොකරන රජයෙන් වන පැවරුම් ස්කන්ධයේ වෙනම සංරචක ලෙස වත්කම් හා වගකීම් ප්‍රකාශනයේ හෙළිදරව් කර නොතිබුණි. | 2021 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ප්‍රමිත හා ගැසට් පත්‍රයේ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ප්‍රමිතියේ 9.15 වගන්තිය ප්‍රකාරව සහා වන්දිවල දඩ මුදල් අනුව උචිත විශ්ලේෂණයක් සහිතව දඩ මුදල් වශයෙන් හඳුනාගත් අයභාර හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදිව ගිණුම් ඉදිරිපත් කරමි. | ප්‍රමිත හා ගැසට් පත්‍රයේ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඉ) | ප්‍රමිතියේ 11.10 වගන්තිය ප්‍රකාරව අසම්භාව්‍ය වගකීම් හා 11.11 වගන්තිය ප්‍රකාරව අසම්භාව්‍ය වත්කම් පිළිබඳව හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදිව ගිණුම් ඉදිරිපත් කරමි. | ප්‍රමිත හා ගැසට් පත්‍රයේ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (උ) | ප්‍රමිතියේ 15.13 වගන්තිය ප්‍රකාරව සභාවේ හුවමාරුවන හා හුවමාරු නොවන ගණුදෙනුවල ලැබිය යුතු දෑ වල අයකර ගත නොහැකි ලෙස ලියාහැරීමේ යම් වටිනාකම් හා ඒ සඳහා අනුමැතිය වෙන් වෙන් වශයෙන් හෙළිදරව් කළ යුතු වුවත්, රු.306,989 ක හඳුනා නොගත් ගබඩා තොගය සම්බන්ධයෙන් හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදිව ගිණුම් ඉදිරිපත් කරමි. | ප්‍රමිත හා ගැසට් පත්‍රයේ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ආධාර යටතේ සිදු කරන කර්මාන්ත ණයහිමි ගිණුම්ගත කිරීමේදී කෙරීගෙන යන වැඩ ලෙස රු.76,795,596 ක් වූ මාර්ග, රු.1,168,683 ක් වූ ගොඩනැඟිලි හා රු.4,487,891 ක් වූ ළමා උද්‍යාන වශයෙන් එකතුව රු.82,452,170 ක් මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට පුනරාවර්තන වියදම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | 2021 වර්ෂයේදී කෙරීගෙන යන වැඩ ලෙස ලෙජර් ගිණුමක් ආරම්භ කර අදාළ ගැළපීම් සිදුකිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව කාරුණිකව දන්වමි. | කෙරීගෙන යන වැඩ නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | 2020 දෙසැම්බර් 31 දිනට දේශීය ණය සංවර්ධන අරමුදලේ ණය රු.7,211,200 ක් ගිණුම්ගත කර ඇති අතර නැවත එම වටිනාකම අයකරගත හැකි උපයෝගී සේවා ණය ගිණුම ලෙස ජංගම වත්කමක් ලෙසද ගිණුම්ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ජංගම වත්කම් එම වටිනාකමින් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී පළාත් සභාව විසින් මුද්දර ගාස්තු ලබා දීමේදී කම්පැක්ටර් රථ ණය වාරික මුදල වූ රු.6,668,000 ක් මුද්දර ගාස්තුවලින් අඩු කිරීම කම්පැක්ටර් රථ ණය ගිණුමට හර කරනු වෙනුවට විවිධ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. මේ හේතුවෙන් ජංගම බැරකම් හා සමාලෝචිත වර්ෂයේ අයභාරය ඉක්මවූ වියදම රු.6,668,000 ක් බැගින් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | 2021 ගිණුම සකස් කිරීමේදී පළාත් සභා ණය ගිණුම යටතේ අදාළ ගෙවීම් සිදු කරමි. | ණය වාරික ගෙවීම් නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ඈ) | මූල්‍ය ප්‍රකාශන අනුව නාගරික සංවර්ධන අධිකාරියේ සේවා ගාස්තු ලෙස රු.8,579,289 ක ජංගම වගකීම් ගිණුමක් ඇතත් එයට අදාල බැංකු ගිණුමේ එම වටිනාකම වෙනුවට රු.2,229,289 ක් ගිණුම්ගත කිරීම නිසා රු.6,350,000 කින් ජංගම වත්කම් අඩුවෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයට අදාල ප්‍රාග්ධන ප්‍රදාන රු.165,076,733 ක් වූවත් එය විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ වෙනත් විස්තීරණ ආදායම් යටතේ රු.89,830,010 ක් ලෙස දැක්වීමෙන් රු.75,246,722 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. තවද, පුනරාවර්තන නොවන වියදම් සඳහා ප්‍රාග්ධන ප්‍රදාන රු.7,708,776 ක් වුවත් එය රු.165,076,733 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා අයභාරය ඉක්මවූ වියදම රු.157,367,955 කින් අඩුවෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම් නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ඊ) | 2020 දෙසැම්බර් 31 දිනට වත්කම් හා බැරකම් ප්‍රකාශනයේ හඳුනා නොගත් ප්‍රාග්ධන ප්‍රදාන රු.157,367,955 ක් වූවත් එය ගිණුම්ගත නොකිරීම නිසා ස්කන්ධය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (උ) | සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු මූල්‍යාධාර රු.82,452,170 ක් ජ'නල් සටහන් 51 මගින් ගිණුම්ගතකර ඇතත්, නැවත ජ'නල් සටහන් 49 මගින් රු.82,624,561 ක් ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ජංගම වත්කම් වැඩියෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ඌ) | පසුගිය වර්ෂයේදී ප්‍රාග්ධන වියදම් රු.35,216,453 ක් වෙනුවෙන් ණයහිමි වෙන් නොකිරීම නිසා එය නිවැරදි කිරීමට සමාලෝචිත වර්ෂයේදී දේපළ, පිරියත හා උපකරණ හෝ කෙරීගෙන යන වැඩ යටතේ | 2021 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | හර කරනු වෙනුවට සමුච්චිත අරමුදලට හර කර තිබුණි. | | |
| (එ) | ජ'නල් අංක 48 හා ජ'නල් අංක 52 මගින් පොදු ගබඩා තොග ගිණුම රු.5,739,637 ක් හා විදුලි ගබඩා තොග ගිණුම රු.998,326 ක් හර කර අදාල ණයහිමි ගිණුම් දෙවරක් බැර කර තිබුණි. 2020 දෙසැම්බර් 31 දිනට පොදු ගබඩා ණයහිමියන් හා ගබඩා, විදුලි තොගය එකතුව රු.6,737,963 කින් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ඒ) | 2020 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.11,874,863 ක් වූ කර්මාන්ත ණයහිමියන් 20 ක් හා රු.483,673 ක වියදම් ණයහිමියන් 11 ක් අඩුවෙන් ගිණුම්ගත කිරීම නිසා ජංගම වගකීම් හා අයහාරය ඉක්මවූ වියදම එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 2021 අවසන් ගිණුම සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. |

### 1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 06 කට අදාළ මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම හා උපලේඛන අනුව වටිනාකම අතර රු.211,181,175 ක වෙනසක් නිරීක්ෂණය විය. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ලේඛන හා උපලේඛන නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. |

### 1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.82,931,551 ක් වූ ගිණුම් විෂයයන් 02 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | අදාළ අනුමැතිය හා විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.645,242,866 ක් වූ අතර ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.96,343,250 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් බදු** | | |
| | සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟහිටි වරිපනම් වටිනාකම රු.51,006,925 ක් විය. | 2020 වර්ෂයට අදාළ කොවිඩ් වසංගතය හේතුවෙන් ආදායම් එකතු කිරීමට අදාළ ජංගම සේවා, දේපළ තහනම් කිරීම් ආදී විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම. | හිඟ ආදායම් අයකර ගැනීම සඳහා කඩිනම් පියවර ගත යුතු වේ. |
| (ආ) | **කඩකුලී** | | |
| | සභාවට අයත් පැරණි වෙළඳ පොලෙහි පිහිටි වර්ග අඩි 837.22 ක් වූ කඩ කාමර 8 කින් හා වෙළඳ සංකීර්ණයේ පිහිටි වර්ග අඩි 1441.86 ක් වූ කඩ කාමර 116 කින් 2020 දෙසැම්බර් 31 දිනට පැවති හිඟ කඩ කුලිය රු.12,234,955 ක් වූ අතර ඉන් සමාලෝචිත වර්ෂයේදී කඩ කාමර 76 කින් කිසිදු කඩ කුලී මුදලක් අයවී නොතිබුණු අතර එයින් අයවිය යුතු මුළු හිඟ කුලිය රු.4,911,360 ක් විය. | 2019 වර්ෂයේදී සිදුකරන ලද නව තක්සේරුව හේතුවෙන් ඊට විරුද්ධ වූ කුලී හිමියන් විසින් කුලී ගාස්තු ගෙවීම පැහැර හැරීම නිසා Covid -19 වසංගත තත්වය හේතුවෙන් තක්සේරු කටයුතු සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදුකර ගැනීමටද නොහැකි වූ බවත් 2021 වර්ෂයේදී මෙම මුදල් අයකර ගැනීමට කටයුතු කරන බවත් දන්වමි. | හිඟ කඩකුලී අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතු වේ. |